


### සිරගත නොවීමට හේතුව

සිරිපාලට රජයේ රැකියාවකට යාමට අවස්ථාවක් ලැබිණ. රැකියාව සඳහා අවශ්‍ය පෝරම පිරවීම සඳහා ඔහු අමාත්‍යංශයට ගියේය.
එම පෝරමයේ නම ලිපිනය අධ්‍යාපනික සුදුසුකම් ආදිය පිරවීමෙන් පසු ඔබ ඔබ සිරගත වී ඇත්ද යනුවෙන් අසා තිබිණ. ඔහු ඒ සඳහා "නැත'' යනුවෙන් ලිවීය. ඊළඟට තිබුණේ එසේ නම් එයට හේතුව යන්න පිරවීමටය. ඔහු මඳ වෙලාවක් කල්පනා කොට "**කරන ලද හොරකම් කිසිවක් පොලිසියට අසු නොවීම**" යනුවෙන් ලිවීය.

### දක්ෂයා තෝරපු හැටි

එක්තරා මෘදුකාංග නිපදවන ආයතනයකට ඉංජිනේරුවෙකුගේ අවශ්‍යතාවය පැන නැගී ඒ සඳහා ඔවුන් පුවත්පත් දැන්වීමක් පළ කළහ. මේ සඳහා ඉංජිනේරුවන් හතළිහක් පමණ අයදුම් කළ අතර ලිඛිත පරීක්ෂණයකින් ඉහළම ලකුණු ගත් දෙදෙනා වන සුගත් සහ ජගත් අවසාන පරීක්ෂණයකට පෙනී සිටියහ. එම පරීක්ෂණයෙන් ද දෙදෙනාම සම ලකුණු ප්‍රමාණයක් ගැනීම නිසා පරීක්ෂණ මණ්ඩලයට තවත් පරීක්ෂණයක් තැබීමට සිදු විය. එම පරීක්ෂණයෙන් ජගත් තේරී පත්විය.මේ නිසා සුගත්ට තමන්ගේ හා ජගත්ගේ ලකුණු ප්‍රමාණයන් පරික්ෂා කිරීමට උවමනා විය, දෙදෙනාම පිළිතුරු සපයා තිබුනේ එකම අයුරිනි. එසේනම් එක්කෙනෙක් තෝරාගත්තේ කෙසේදැයි සුගත් පරීක්ෂණ මණ්ඩලයෙන් විමසීය.

"මේ දෙන්නම එකම උත්තර තමයි ලියල තිබුණෙ දෙන්නගෙම උත්තර හරි. හැබැයි ඔයා ලියලා තිබුණු විදියෙ වෙනසක් නිසා තමයි අරයව තෝරගත්තෙ''. පරීක්ෂකවරයා කීය.

" මොකක්ද මං ලියපු එකේ වෙනස'' සුගත් ඇසීය

" ප්‍රශ්නයකට ජගත් උත්තර දීලා තිබුණේ **මට හිතෙන විදියට කියලා.** ඉතිං එම ප්‍රශ්නයටම ඔබ උත්තර දීලා තිබුණේ **මටත් හිතෙන විදියට** කියලා. දෙන්නම එක ළඟනේ උත්තර ලියද්දි හිටියෙ නේද''? පරීක්ෂක වරයා කීය .

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au




ආණ්ඩුව ජනතාව රවටා එම් සී සී ගිවිසුම අත්සන් කරන්න හදනවා
විජිත හේරත්

එතකොට පහුගිය ආණ්ඩු කාලෙ අස්සන් කොරන්න හැදුවෙ ඔය ගිසුමම නෙවෙයිද? ඒ කාලෙ උන්නැහේ ඔය ගැන වචනයක්වත් දෙඩුවෙ නැති නිසා ඇහුවෙ
අබරන්

# ලින්කන් යන්න කැමති තැන

වසර 1806 දී ලීයෙන් තැනූ කුඩා මඩුවක උපන් ඒබ්‍රහම් ලින්කන් වයස අවුරුදු පනස් හතරේදී එනම් 1860 දී ඇමරිකාවේ 16 වැනි ජනාධිපති වරයා බවට පත් වුණා.උපන් දා සිට ජනාධිපති පදවිය දක්වා ඔහු ආ ගමන විශ්වාස කරන්නටත් බැරි තරම්. පීඩිත පන්තිය වෙනුවෙන් පෙනී සිටි ඔහු වෙත අති විශාල ජන ප්‍රසාදයක් ඇතිවීම ඔහුගේ මෙම විජයග්‍රාහී ගමනට හේතුවයි. ඔහුගේ ජීවිතය නොයෙකුත් අන්දමේ රසවත් කතාන්දරවලින් බහුල එකක්.

1860 දී එක්තරා පූජකවරයෙක් ලින්කන්ගෙ ජයග්‍රහණය උදෙසා රැස්වීමක කතා කළා. එක් අවස්ථාවක මේ පූජකවරයා සභාවට කියනවා "දැන් මෙතන ඉන්න අයගෙන් ස්වර්ගයට යන්න කැමති කට්ටිය නැගිටින්න" කියලා.
මේ අවස්ථාවේ ලින්කන් හැර අනෙකුත් සියළුම දෙනා නැගිටිනවා. පූජක වරයාට විශාල කුතුහලයක් ඇති වුණා. ඊළඟට ඔහු කියනවා සියලුම දෙනා වාඩිවෙලා දැන් මෙතන ඉන්න අයගෙන් අපායට යන්න කැමති නැති අය නැගිටින්න කියලා.

ඒ වතාවෙත් ලින්කන් නැගිටින්නෙ නැතිව වාඩිවෙලා ඉදිද්දි අනෙකුත් සියළුම දෙනා නැගිටිනවා. ඊළඟට පූජකවරයා ලින්කන් ගෙන් විමසනවා "ඔබ ස්වර්ගයට යන්නත් අකමැතිනම්, අපායට යන්නත් අකමැතිනම් කොහෙද යන්න හිතන් ඉන්නේ කියලා". එතකොට ලින්කන් පිළිතුරු දෙනවා "මම යන්න හිතන් ඉන්නෙ මන්ත්‍රී මණ්ඩලයට ඒකටනෙ මේ ඡන්දය තියන්නෙ" කියල. රැස්ව සිටි සියලු දෙනා එවිට ප්‍රීති ඝෝෂා නැගුවා. එවිට පූජකවරයා කියනව "හොඳයි එහෙනම් හොඳයි බතුමාට මන්ත්‍රී මණ්ඩලයට යන්නට දෙවියන්ගේ කැමැත්ත ලැබේවා!" කියලා.

**අරුණ රෝහණදීප**
**බෙරික්,මෙල්බර්න්**

ALPHA ACADEMY
• PRIMARY • SECONDARY • VCE
ENROLMENTS OPEN
YEAR 2-6 ENGLISH, MATHS AND GA GENERAL COURSE
YEAR 5-8 SCHOLARSHIP TEST PREPARATION
YEAR 5-10 ENGLISH, MATHS AND SCIENCE GENERAL COURSE
YEAR 9-10 VCE PREPARATION
YEAR 11-12 VCE CHEMISTRY AND BIOLOGY ENGLISH RECOMMENDED TEXTS, ANALYTICAL WRITING
CLASSES AT DANDENONG
MOUNT WAVERLEY, DANDENONG, BERWICK & CRAIGIEBURN
Classes conducted by Current School Teachers
INQUIRIES - 0480 139 747